# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2029/19 - 2017 ජූලි මස 25 වැනි අඟහරුවාදා - 2017.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය* :- KHDS/LND/04/ACQ/11.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :- LD/05/2009/වීර්/305.

ගම් පුළුල් කිරීම යටතේ බෙදාදීම (මහජන කටයුත්තක්) සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පන්නිල්පත්තුව සුළු කොට්ඨාසයේ පන්නිල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 701 අතිරේක අංක 24, පත්‍ර 24 සහ 2015.01.19 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 804 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 1.9141 ඉඩම් කැබලි.

1. **කැබලි අංක 804**
ඉඩමේ නම: නාලිගෙවත්ත; විස්තරය: ගංවතුරින් හා නාය යෑම් නිසා අවතැන් වූ පවුල් පදිංචි කරවීම සඳහා ගම් පුළුල් කිරීම යටතේ ඉඩම් අත්කර ගැනීම; හිමිකම් කියන අය: අධ්‍යක්ෂ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 1.9141.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 සැප්තැම්බර් මස 06 වැනි දින පෙ. ව. 10.00 ට කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 සැප්තැම්බර් මස 04 වැනි දිනට මත්තෙන්, ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

බී. ටී. ගයානි අයි. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
කහවත්ත.

2017 ජූලි මස 19 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 297

1A - G 25963 - 17 (2017/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.